www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# නව නේපාල ආන්ඩුව මහජන විරෝධතා ව්‍යාපාරය නිෂ්ක්‍රිය කිරීමේ තැතක

## New Nepalese government seeks to defuse mass protest movement

**ඩබ්ලිව්.ඒ. සුනිල්**
**2006 මැයි 8**

ගයනේන්ද්‍ර රජුගේ අත්තනෝමතික පාලනයට එරෙහි සති ගනනාවක මහජන විරෝධතාවලින් පසුව, වසර හතරකට ආසන්න කාලයක් තුල ප්‍රථම වතාවට, අප්‍රේල් 28 දා නේපාල පාර්ලිමේන්තුව යලි කැඳවුනි. ජාත්‍යන්තර ජනමාධ්‍යයන් සහ මහ බලවතුන් මෙම ක්‍රියාව ''සාමය සහ ප්‍රජාතන්ත්‍රවාදය'' දෙසට තැබූ පියවරක් ලෙස වගවර්නනා කර ඇතත්, නිල පාර්ලිමේන්තු පාලනය කරා යලි පැමිනීම, සාමාන්‍ය කම්කරු ජනයාගේ දැවෙන සමාජ අවශ්‍යතා කෙසේ වෙතත් ඔවුන්ගේ මූලික ප්‍රජාතාන්ත්‍රිය අයිතීන් සම්බන්ධ අභිමතාර්ථයන් පවා කවරාකාරයකින් වත් ආමන්ත්‍රනය නො කරයි.

නේපාල කොන්ග්‍රස් (එන්සී) පක්ෂයේ නායක 84 වියැති ගිරිජා ප්‍රසාද් කොයිරාල අගමැති ලෙස පත් කිරීම, රට මුහුන දෙන ආර්ථික සහ සමාජ අර්බුදය විසඳීමට මුලුමනින් ම අසමත් බව ඔප්පු වූ 1990 ගනන්වල පැවති අතිශයින් ම දූෂිත සහ අස්ථාවර පාර්ලිමේන්තු තන්ත්‍රයන් කරා ආපසු යාමක් සනිටුහන් කරයි. නේපාල දේශපාලන සංස්ථාපිතය තුල ප්‍රවීන දේශපාලනඥයෙකු සහ කේන්ද්‍රීය පුද්ගලයෙකු වන කොයිරාල අප්‍රේල් 30 දා නිල වශයෙන් රජු ඉදිරියේ දිවුරුම් දුන්නේ ය.

තමන් තුනී අයිස් තට්ටුවක් මත ලිස්සා යමින් සිටින බව කොයිරාල මැනවින් දනී. හමුදාව සහ පොලීසිය සමග ගැටෙමින් සිය ජීවිත පරදුවට තැබූ ජනගහනයේ විවිධ ස්තරවලට අයත් දසදහස් ගනන් ජනයා රාජාන්ඩු පාලනය අහෝසි කිරීම ඉල්ලා සිටි රැලිවලට සහභාගි වූහ. ආරක්ෂක හමුදා සමග ගැටීමෙන් අවම වශයෙන් 21 දෙනෙකු මිය ගිය අතර බොහෝ දෙනෙක් තුවාල ලැබූහ.

විශේෂයෙන් තරුන ජනයා අතර රජු කෙරෙහි පමනක් නො ව කොයිරාල සහ විරුද්ධ පක්ෂ කෙරෙහි ද විරුද්ධත්වයක් ඇත. පසු ගිය සතියේ ඇමති තනතුරු සඳහා පාර්ලිමේන්තුව තුල කා කොටා ගන්නා අතරතුර සිය ගනන් ශිෂ්‍යයෝ තමන්ගේ ඉල්ලීම් ගැන හඬ නැගීම සඳහා පාර්ලිමේන්තුවට කඩාවැදීමට උත්සාහ කලහ. ''නායකයන් වන නුඹලා බලය සඳහා කෑදරකම පසෙක තබා මහජනතාවගේ අභිමතාර්ථයන්ට අනුව වැඩ නො කලොත් අපි නුඹලාගේ ගෙවල් වට ලන්නෙමු" යි ඔවුහු හඬ නැගූහ.

මැයි 2 දා කොයිරාල සත් සාමාජික අන්තර්-කාලීන අමාත්‍ය මන්ඩලයක් නිවේදනය කලේ ය. එක්සත් මාක්ස්-ලෙනින්වාදී නේපාල කොමියුනිස්ට් පක්ෂය (සීපීඑන්-යූඑම්එල්), නේපාල ප්‍රජාතන්ත්‍රවාදී කොන්ග්‍රස් පක්ෂයට සහ එක්සත් වාම පෙරමුනට එක බැගින් සහ ඔහුගේ පක්ෂයට ඇමති තනතුරු හතරක් තිබේ. කොයිරාලට ප්‍රධාන ආරක්ෂක ඇමතිකම ද තවත් නේපාල කොංග්‍රස් සාමාජිකයෙකු වූ ක්‍රිෂ්නා සිතෝලාට පොලීසියේ භාරකාරත්වය සහිතව ස්වදේශ ඇමතිකම ද තිබේ. එක්සත් මාක්ස්-ලෙනින්වාදී නේපාල කොමියුනිස්ට් පක්ෂයේ නායක කේ.පී. ෂර්මා ඔලී නියෝජ්‍ය අගමැති සහ විදේශ ඇමති ලෙස පත් කර ඇත.

2002 දී ගයනේන්ද්‍ර රජු පාර්ලිමේන්තුව වසා දැමීමට පෙර, 1991-2002 අතර කාලයේ දී, නේපාල කොන්ග්‍රසය සහ එක්සත් මාක්ස්-ලෙනින්වාදී නේපාල කොමියුනිස්ට් පක්ෂය පරම රාජාන්ඩු පාලනයට එරෙහිව 1990 දී පැන නැගි මහජන විරෝධතාවලින් පසුව සීමාසහිත ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරන තහවුරු කල හෙලෙත්තාඩු සභාග ආන්ඩු ගනනාවක් ම මෙහෙයවා තිබුනි. 1991 දී කොයිරාල අගමැති තනතුරට පත් වූ අතර හමුදාව සහ පොලීසිය සමග ගැටීමෙන් 500ක් ජනයා මරනයට පත් වූ 1990 දී පැන නැගි පලල් විරෝධතා ව්‍යාපාරය නිෂ්ක්‍රිය කිරීමේ දී ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කලේ ය.

එය ම යලි කිරීම සඳහා කොයිරාල දැන් අගමැති තනතුරට පත් කර තිබේ. ගයනේන්ද්‍ර රජුගේ ප්‍රජාතන්ත්‍ර විරෝධී පිලිවෙත්වලට එරෙහි මහජන වෛරය සමහන් කිරීමේ උත්සාහයක් ලෙස රටේ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සලකා බැලීමට ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයක් පත් කිරීම සඳහා මැතිවරනයක් පැවැත්වීමට පාර්ලිමේන්තුව දැනට මත් ඡන්දය දී ඇත. රජු විසින් 2002 සිට සිදු කල සියලු පත්වීම් ද එක්සත් ජනපදය,

ඉන්දියාව, බ්‍රිතාන්‍යය, ජපානය සහ ප්‍රන්සය ඇතුලු රටවල් 12ක තානාපතිවරුන්ගේ පත්වීම් ද අමාත්‍ය මන්ඩලය විසින් අවලංගු කරනු ලැබ තිබේ.

කෙසේ නමුත්, අන් සියල්ලට මත් වඩා, 1996 සිට ගරිල්ලා යුද්ධයක් මෙහෙයවන සහ රටේ පසුගාමී ගම්බද දිස්ත්‍රික්ක ගනනාවක පාලනය අල්ලා ගෙන සිටින මාවෝවාදී නේපාල කොමියුනිස්ට් පක්ෂය මත ආන්ඩුව රැඳී සිටියි. ගයනේන්ද්‍ර රජුට විරුද්ධව ඒකාබද්ධ උද්ඝෝෂනයක් ගෙන යාම සඳහා විරුද්ධ පක්ෂ හත පසු ගිය නොවැම්බර් මාසයේ නව දිල්ලියේ දී මාවෝවාදී නේපාල කොමියුනිස්ට් පක්ෂය සමග නිල එකඟතාවකට එලඹුනහ. මෙම ගිවිසුමේ කොටසක් ලෙස අවසානයේ දී අවි බිම තැබීමට සහ ප්‍රධාන දේශපාලන ප්‍රවාහයට එකතු වීමට මාවෝවාදීහු එකඟ වූහ.

පසු ගිය සතිය පුරා, නව ආන්ඩුව මාවෝවාදීන් සම්බන්ධ කර ගැනීමේ සිය උත්සාහය තීව්‍ර කර තිබේ. කොයිරාල අගමැති තනතුරට පත් වූ දිනයේ ම ඔහු ''ප්‍රචන්ඩ ක්‍රියා අත හැර සාකච්ඡාවලට එන'' ලෙස මාවෝවාදීන්ට ආයාචන කලේ ය. මාවෝවාදී නේපාල කොමියුනිස්ට් පක්ෂය ද ආන්ඩුවේ කැඳවුමට ප්‍රතිචාර දක්වමින් සිටී. ගයනේන්ද්‍රගේ යෝජනාව පක්ෂ හත විසින් පිලිගැනීම ''ඓතිහාසික වැරැද්දක්'' ලෙස මුල දී හෙලා දුටු මාවෝවාදී නායකත්වය, සටන් විරාමයක් නිවේදනය කරමින් සහ සාකච්ඡාවලට එලඹීමට ඔවුන්ට ඇති කැමැත්ත පෙන්වමින් ක්ෂනිකව ම වඩාත් සමථකාරී හඬකට අනුගත වූහ.

මහජන විරෝධතා ව්‍යාපාරය සීමා කිරීමට මාවෝවාදීන් උපයෝගී කර ගැනීම සම්බන්ධයෙන් කොයිරාල ඔහුගේ පැත්තෙන් සංවේදී ය. මැයි 3 දා අනියත සටන් විරාමයක් ප්‍රකාශයට පත් කල ආන්ඩුව, මාවෝවාදී නේපාල කොමියුනිස්ට් පක්ෂය සම්බන්ධ ''ත්‍රස්තවාදී'' නාමය ඉවත් කර බන්ධනාගාරගත කර සිටින සිය ගනනක් මාවෝවාදී කැරලිකරුවන් නිදහස් කිරීමට මූලික පියවර ගැනීම ආරම්භ කලේ ය. ''අපි දැනට මත් මාවෝවාදීන් සාකච්ඡාවලට කැඳවා ඇත්තෙමු. සාකච්ඡා ආරම්භ කල වහා ම විවිධ බන්ධනාගාරවල රඳවා සිටින කැරලි නායකයන් ද නිදහස් කරනු ඇත'' යි කැබිනට් ඇමති මාන් ශ්‍රේස්තා ප්‍රන්ස පුවත් ඒජන්සියට පැවසී ය.

කොයිරාලගේ ආන්ඩුව වැලඳ ගැනීමට මාවෝවාදීන්ගේ ඇති කැමැත්ත දේශපාලන බංකොලොත්කම නිහඬව පිලිගැනීමකි. එක්සත් මාක්ස්-ලෙනින්වාදී නේපාල කොමියුනිස්ට් පක්ෂය බඳු සෙසු නේපාල ස්ටැලින්වාදී පක්ෂ අතර සිටින තම දේශපාලන සතුරන් ගමන් කල මාවතට සමාන මාවතක් මාවෝවාදී නේපාල කොමියුනිස්ට් පක්ෂය අනුගමනය කරමින් සිටී. වර්තමාන දේශපාලන අර්බුදය තුල ධනේශ්වර පාලනය පවත්වා ගෙන යාමේ වැදගත් මුක්කුවක් බවට මාවෝවාදී නේපාල කොමියුනිස්ට් පක්ෂය පත්ව තිබේ.

හමුදාව අතේ තව මත් ආයුධ තිබෙන තතු තුල නිරායුධ වීම ගැන කතා කිරීම ''ස්වයං-නාශක සිහිනයක්'' බව ප්‍රධාන මාවෝවාදී නායක ප්‍රචන්ඩ ප්‍රකාශ කර ඇත. කෙසේ නමුත්, ඒ සමග ම, අප්‍රමාදව සාකච්ඡා සංවිධානය කරන ලෙස සහ ''විශ්වාසය පිලිබඳ යහපත් වාතාවරනයක් නිර්මානය කිරීම'' සඳහා දේශපාලන සිරකරුවන් නිදහස් කරන ලෙස ඔහු ආන්ඩුවෙන් දැඩිව ඉල්ලා තිබේ. ''මාවෝවාදීන් ස්ථිර වසයෙන් ම අන්තර්-කාලීන ආන්ඩුවට සම්බන්ධ වනු ඇතැ"යි මාවෝවාදී නායක විනෝද් උපාධ්‍යායි ප්‍රකාශ කරන බව නේපාල සඟරාවක උපුටා දක්වා ඇත.

පසු ගිය මාසයේ සිද්ධීන්වල දී තමන් දේශපාලනිකව නොවැදගත් තැනකට තල්ලු කෙරී ඇති බව පිලිබඳව ඔවුන්ගේ සැලකිල්ල යොමු වීම දේශපාලන සංස්ථාපිතය සමග සම්බන්ධ වීමට මාවෝවාදී නේපාල කොමියුනිස්ට් පක්ෂයට ඇති ඉමහත් කැමැත්ත මගින් පිලිබිඹු කෙරෙයි. ආර්ථිකව පසුගාමී ගම්බද ප්‍රදේශවල දී ඔවුන්ගේ කැරලිකාරී හමුදාවට අර්ථභාරී තැනක් ඇති නමුදු, මෑත ම මහජන විරෝධතා සංකේන්ද්‍රනය වූ ප්‍රධාන නගර සහ සෙසු නගරවල දී පක්ෂයට ඇත්තේ කුඩා බලපෑමකි. ආන්ඩුව සහ ව්‍යාපාර තුල තනතුරු සඳහා ඔවුන්ගේ ස්වයංක්‍රිය රයිෆල දැනට මත් හුවමාරු කර ගෙන ඇති ලොව පුරා ගරිල්ලා සංවිධානවල දිගු පෝලිමට සම්බන්ධ වීම සඳහා මාවෝවාදී නේපාල කොමියුනිස්ට් පක්ෂය දැන් සූදානම් වෙමින් සිටී.

පාලනය අත හැර යලි පාර්ලිමේන්තුව කැඳවීමට ගයනේන්ද්‍රට බල කිරීමේ දී එක්සත් ජනපදය, යුරෝපා සංගමය, ඉන්දියාව සහ චීනය තිරයට පිටුපසින් ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කලේ ය. විශේෂයෙන් ම, පසු ගිය නොවැම්බර් මාසයේ දී විරුද්ධ පක්ෂ සහ මාවෝවාදීන් අතර එකඟතාවක් ඇති කර ගැනීමට උපකාර කල නව දිල්ලිය, රජු මත පීඩනය යෙදීමේ රාජ්‍ය තාන්ත්‍රික ප්‍රයත්නයන්හි හරි මැද සිටියේ ය. සියලු ප්‍රධාන බලවතුන්ගේ පොදු භීතිය වූයේ, නේපාලය තුල නොසන්සුන්කම අසල්වැසි රටවලට පැතිරී යාමට ඇති හැකියාව ගැන ය.

අප්‍රේල් 27 දා *වෝල් ස්ට්‍රීට් ජර්නල්*හි පල වූ ලිපියක සමීප ජාත්‍යන්තර සහයෝගිතාව මෙලෙස විස්තර කෙරුනි: ''ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යලි පිහිටුවීමට ද මාවෝවාදී සටන්කාමීන් විසින් දශකයක් පුරා ගෙන යන කැරැල්ලේ වර්ධනය පෝෂනය කිරීමට තර්ජනය කරන්නා වූ ගැටුමක් අවසන් කිරීමට ද ගයනේන්ද්‍ර රජු මත පීඩනය යෙදීම සඳහා මෑත සතිවල දී එක්සත්

ජනපදය, ඉන්දියාව, චීනය මෙන් ම බ්‍රිතානය ද සමීපව ක්‍රියා කර ඇත. ප්‍රශ්නයට සාමූහික ප්‍රවිෂ්ටයක් ඇති කර ගැනීම සඳහා තානාපතිවරු එකිනෙකා අතර සාකච්ඡා කලහ. තානාපතිවරු ගනනාවක් එකෙකුට පසුව තවකෙකු බැගින් රජු මුන ගැසී අවසාන රාජ්‍ය තාන්ත්‍රික බල කිරීමක් කලහ. හමු වීම පිලිබඳ කරුනු දන්නා එක් රාජ්‍ය තාන්ත්‍රිකයෙකුට අනුව ඔවුහු සාමූහික පනිවුඩයක් දුන්හ: එනම් පසෙකට වී සිටිනු යන්න යි.''

ගයනේන්ද්‍රගේ තීන්දුවත් සමග ම, ප්‍රධාන බලවත්තු කොයිරාල ආන්ඩුවට මුක්කුව දීමට වැඩ කරමින් සිටිති. දකුනු ආසියාව පිලිබඳ එක්සත් ජනපද රාජ්‍ය ලේකම් රිචඩ් බවුචර් පසු ගිය සතියේ නේපාලයට ගොස් පක්ෂ නායකයන් මෙන් ම හමුදා ප්‍රධානියාත් හමු විය. නමුත් හිතාමතා ම රජු හමු නො වී ය.

එක්සත් ජනපදය සහ එහි මිතුරන් නව ආන්ඩුවට සහයෝගය දෙන්නේ නේපාලය තුල "ප්‍රජාතන්ත්‍රවාදය" ස්ථාපිත කිරීමට නො ව, නිශ්චිතව ම ප්‍රතිවිරුද්ධ හේතුවක් නිසා ය: පොදු ජනතාවගේ මැදිහත් වීමේ සහ ධනවාදී රාමුව තුල සාක්ෂාත් කල නොහැකි යහපත් ජීවන කොන්දේසි සහ මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් පිලිබඳ ඔවුන්ගේ ඉල්ලීම්වල හිස ගසා දැමීම සඳහා ය.

© www.wsws.org